


ශ්‍රී. බු. ව. 2555 ඉල් මස කලාපය, රා. ව. 2011 ක් වූ නොවැම්බර් මස 10 වන දින

මාතර,ශ්‍රී සුදර්ශි මහ පිරිවෙන්හි පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති
ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# <u>පිළිවෙලකට වැඩ කිරීම ශක්තිමත් ජීවිතයක පදනමයි.</u>

කාරුණික පින්වතුනි,

අද ඉල් පුර පසළොස්වක පොහොය දිනය යි. බුදුරජාණන් වහන්සේ පළමුවරට තම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ධර්මදූත සේවාවෙහි යෙදවීම, තථාගතයන් වහන්සේ තුන් බෑ ජටිලයන් වෙත වැඩම කරවීම, මෛත්‍රී බෝසතාණන් වහන්සේ විවරණ ලැබීම, සැරියුත් හිමියන්ගේ මෑණියන් මාර්ගඵල ලැබීම, ආදී ශාසන ඉතිහාසය තුළ වැදගත් සිදුවීම් රාශියක් සිදුවූයේ අද වැනි පොහොය දිනකයි. තුන් මාසයක් වස්වසා වැඩ සිටි මහා සංඝරත්නය වප් පොහොය දින පවාරණයට පත්ව සිදුකරන කඨින පිංකම් අවසන් වන්නේ ද මෙම පොහොය දිනයෙනි.

අද මෙම දහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ පිළිවෙලකට වැඩ කිරීමෙන් ජීවිතය ශක්තිමත් කරගත හැකි සැටි බුදුදහම අනුව විමසා බැලීම යි. ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීම සඳහා අපමණ කාලයක් දානාදී පාරමිතා පිරූ බව සඳහන් වේ. ඒ ක්‍රියාවලිය තුළ දැකිය හැක්කේ පිළිවෙලකට වැඩ කිරීම ය. එසේ තම ජීවිතය ශක්තිමත් කරගත් බුදුන්වහන්සේ අවුරුදු 45 ක් තුළ යම් යුක්ති ධර්මයක් දේශනා කළානම් ඒ සියලු ධර්මයන්ගේ අපේක්ෂාව පිළිවෙලකට වැඩ කොට පුද්ගලයා දෙලොවින් ශක්තිමත් කිරීමයි.

බුදුන් වහන්සේ වැඩසිටි යුගයේ භාරතයේ පැවතියේ වේද දහමින් සංවිධානය කරන ලද බ්‍රාහ්මණ ආගම යි. බමුණු දහම තුළ පැවති අපිළිවෙල දුටු ජනතාව එම බ්‍රාහ්මණ ඉගැන්වීම් වල එන නිසරු බව දැක ඒවා ප්‍රතික්ෂේප කළහ. ඉන් අනතුරුව ශ්‍රමණයින් වහන්සේලා පිරිසක් බිහිවිය . නිගණ්ඨ - අචේලක - පරිබ්‍රාජක - ජටිල - ආජීවක - යනුවෙන් හැඳින්වෙන්නේ එම ශ්‍රමණ කණ්ඩායම් ය. ඔවුන්ගේ ජීවිත තුළ ද පවත්නා අපිළිවෙල දුටු භාරතීය ජනතාව ඔවුන් ද ප්‍රතික්ෂේප කළ හ. මෙවන් පසුබිමක් යටතේ තථාගතයන් වහන්සේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කරමින් සුවිශේෂී ශ්‍රමණ පිරිසක් ඇති කළ හ. බෞද්ධ සංඝ නමින් හැඳින්වෙන්නේ එම සුවිශේෂී ශ්‍රමණ කණ්ඩායමයි.

එම සුවිශේෂී ශ්‍රමණයින්වහන්සේලා අමතා "මහණෙනි, ඔබ වහන්සේලා එක මගකින් දෙදෙනෙක් නොගොස් ධර්මය ප්‍රචාරය කරන ලෙස අවවාද කළ හ". එම අවවාද මත ක්‍රියා කළ භික්ෂූන් වහන්සේලා එසේ ධර්මය ප්‍රචාරය කරනු දුටු ඇතැම් අය කීවේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ ශිෂ්‍යයින් තුළ ද පිළිවෙලක් නැත කියා යි. ඊට හේතුව වර්ෂා කාලය තුළත් අපේ භික්ෂූන් වහන්සේලා නිල් තණ කොළ පාගමින්, කුඩා සතුන් පාගමින් ගමන් කිරීම යි. විශේෂයෙන්ම ජෛන ශ්‍රාවකයින් මෙහිදී බෞද්ධ භික්ෂූන්ගේ මේ අපිළිවෙල ගැන අප්‍රසාදය පළ කළහ. මෙහිදී බුදුන්වහන්සේ දේශනා කළේ මහණෙනි, ඔබ වහන්සේලාගේ අපිළිවෙල ගැන ජනතාව අප්‍රසාදය පළකොට ඇත. පිළිවෙලකට වැඩ කරන කෙනෙක් නම් වැසිකාලය තුල චාරිකාවෙන් ඈත්ව ස්වකීය ආරාමයෙහි වාසය කළ යුතු ය. ප්‍රථම ධම් දේශනාව පවත්වා මම හැම වස්කාලයකම වස් විසුවෙමි. ඔබ වහන්සේලා ද එසේ වාසය කළ යුතුය යි අවවාද කළ සේක. මේ වස් විසීමේ චාරිත්‍රය පනවා වදාළේ භික්ෂු ජීවිතය පිළිවෙලකට සකස් කිරීමේ අපේක්ෂාවෙනි.

මේ ගතවී යන්නේ සිංහල ක්‍රමයට අනුව ඉල් මාසය යි. චීවර මාසය නමින් ද මේ මාසය හඳුන්වන්නේ කඨින චීවර පූජා කරන මාසය බැවිනි. ගිහි පැවිදි දෙපක්ෂයම ඉතා උනන්දුවෙන් සිදුකරන මෙම කඨින පිංකම මේ තරම් වටින පිංකමක් වී තිබෙන්නේ එය සකස් වූ පිංකමක් බැවිනි. භික්ෂූන් වහන්සේලා විහාරස්ථානය තුළ ඉතා සමගි සම්පන්නව කටයුතු කරමින් බුදුන් වහන්සේ දේශණා කර වදාළ විනය ශික්ෂාවන්ට අනුගත වෙමින් තම ජීවිතය සකස්කර ගනී. ගිහි ජනතාව ද වෙනදාට වඩා පන්සල ඇසුරුකරගෙන ආගමික වතාවත්වල යෙදෙමින් තම ජීවිතය සකස් කර ගනිති. මෙසේ ගිහි පැවිදි දෙපක්ෂයේම සකස්වීම තුළ අපමණ බලයක් ගොඩ නැගේ . එම බලය කඨින ශක්තිය නමින් හැඳින්විය හැක.

ගිහි පැවිදි සබඳතාවයේ සකස්වීම පිළිබඳ ඉතා වැදගත් විස්තරයක් සිගාලෝවාද සූත්‍රයේ සදිසාවෙහි සඳහන්වේ. සදිසාවේ උඩ දිසාව මහණ බමුණෝ ය. එහි දී භික්ෂුව විසින් දායක පක්ෂයට යුතුකම් හයක් ඉටුකළ යුතු අතර දායකයා විසින් භික්ෂුවට යුතුකම් පහක් ඉටුකළ යුතු යි.

ගිහි දායකයා තම භික්ෂුවට කයින් වචනයෙන් සහ මනසින් මෛත්‍රී සහගතව ක්‍රියාත්මක විය යුතු යි. තම භික්ෂූන් වහන්සේලා තමන්ගේ නිවසට වැඩම කළ විට සුහදව පිළිගත යුතු ය. තම භික්ෂූන් වහන්සේලාට චීවර- පිණ්ඩපාත- සේනාසන- ගිලන්පස යන සිව්පසයෙන් සැලකිය යුතු යි. මේ යුතුකම් පහෙන් භික්ෂූන් වහන්සේලාට උදව් උපකාර කරන ගිහියා සකස් වූ ගිහියෙකි. ඔහුගේ වටිනාකම තිබෙන්නේ එම සකස්වීම මත ය.

මෙසේ ගිහි ජනතාවගෙන් උපකාර ලබාගෙන ජීවත්වන භික්ෂූන් වහන්සේලා තම දායකයින් පවින් වළක්වා, යහපතෙහි පිහිට විය යුතු යි. කරුණාවන්ත සිතින් දායකයින්ට අනුකම්පා කළ යුතු යි. නොඇසූ ධර්මය කියා දෙමින් ඇසූ ධර්මය වැඩි වැඩියෙන් ප්‍රගුණ කළ යුතු යි. මේ යුතුකම් හය දායකයින් වෙනුවෙන් ඉටුකළ හැක්කේ සකස් වූ භික්ෂුවකට පමණි.

ඉහත කී ආකාරයට බෞද්ධ සමාජය තුළ ගිහි පැවිදි දෙපක්ෂය සකස් වූ විට මහා ශක්තියක් ගොඩ නැගේ. එම ශක්තිය හැඳින්වීම සඳහා මේ සිගාලෝවාද සූත්‍රය වචන දෙකක් භාවිතා කරයි. "ඛෙමා අපපටිභයා" යනු එම වචන දෙක යි. නිරුපද්‍රිත බව, භය රහිත බව යනු

එම වචන දෙකේ තේරුම යි. සමාජය තුළ උපද්‍රව රහිත ව, භය රහිත ව ජීවත් විය හැක්කේ ඉහත කී ආකාරයට සකස්වීම තුළිනි. එවිට එම ජීවිත කොතරම් වටී ද?

ඉහත කී ආකාරයට සකස් නොවූ ගිහියන් තම යුතුකම් භික්ෂූන් වහන්සේලාට ඉටු නොකරන විට විවිධ ගැටළු පැන නගී. එවිට ගිහියා උපද්‍රව සහිතව බියෙන් ජීවත්වෙයි. භික්ෂුව ද තම යුතුකම් ඉටු නොකරන විට උපද්‍රව සහිතව බියෙන් ජීවත්වන්නට සිදුවේ. මේ ගිහි පැවිදි සබඳතාවය වෙනදාට වඩා ක්‍රියාත්මක වන්නේ වස් විසීමේ චාරිත්‍රය ඉටු කොට සිදුකරන කඨින පිංකම තුළිනි. ඒ අනුව කඨින පිංකම යනු ගිහි පැවිදි දෙපක්ෂයේම සකස්වීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

වස් විසීමේ චාරිත්‍රය ඉටුකොට භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කිරීමක් කරනු ලැබේ. පොහොය සීමාවකට ගොස් සිදුකරන එම පවාරණය තුළින් ද දැකිය හැක්කේ භික්ෂුවගේ සකස්වීම කි. තුන්මාසයක් එකට සමගියෙන් ජීවත් වූ අපි අද වස් අවසන් කරමි. මේ කාලය තුළ මාගෙන් කිසියම් වරදක් සිදුවනු දුටුවානම් (දිටෙඨනවා) ඇසුවා නම් (සුතෙනවා) සැකයක් හෝ ඇත්නම් (පරිසංකායවා) මට දන්වන්න. මම ඒ වරද සකස්කර ගනිමි. මේ පවාරණ වාක්‍ය තුළ දී භික්ෂුව ඉතා අනතිමානීව කියා සිටින්නේ මගේ චරිතය තුළ අඩුපාඩු කමක් තිබේනම් එය සකස් කරගන්නා බව යි. එසේ අඩුපාඩු කම් සකස් වූ ජීවිතය කොතරම් වටිනාවාද යන්න මෙයින් පැහැදිලි වේ.

වස් අවසානයෙහි පූජා කරන කඨින සිවුරුද මෙතරම් වටින්නේ සකස් වූ සිවුරක් බැවිනි. එම කඨින චීවරය ලබා ගැනීමට තුන් මාසයක් වස් වසා ආරක්ෂා කරගත යුතුයි. දායක පින්වතුන් සියලු දෙනාගේ සහභාගිත්වයෙන් ලබා දෙන මේ කඨින සිවුර සාංඝිකව පූජා කළ පසු භික්ෂූන්වහන්සේලා එම සිවුර සීමා මන්දිරයකට ගෙන ගොස් විනය කර්මයක මාර්ගයෙන් වස් ආරක්ෂාකර ගත් භික්ෂුවකට පවරයි. සිවුර ලබාගත් භික්ෂුව එම සිවුරට පැවැත්විය යුතු උපචාර විධි රාශියකි. ඒ සියලු කටයුතුවලින් කෙරෙන්නේ මේ සිවුර විනයානුකූලව සකස් වීමකි. මේ තරම් සකස්වන ඇඳුමක් මේ සමාජය තුළ තවත් නැත. මේ සකස්වීම තුළ ගිහිපැවිදි දෙපක්ෂය තුළ සමගියක් ගොඩ නැගේ. එම සමගියෙන් ශක්තිය කඨින ශක්තිය ලෙස හැඳින්විය හැක.

මේ දිනවල විහාරස්ථානවල ධර්ම ශාලා ගිහි ජනතාවගෙන් පිරී ඉතිරී යනු දැකිය හැක. ඒ ජනතා සහභාගිත්වය සිදුවන්නේ කඨින සිවුර විසින් ඇතිකරනු ලබන සමගිය තුළිනි. සමහර විහාරස්ථානවල කඨිනය එක් දායක පවුලක් භාරගෙන කරනු පෙනේ. එහිදී මුලින් කී පොදු බවේ අඩුවක් දැකිය හැක. එවැනි තැන්වල ජනතා සහභාගිත්වය අඩු වූ විට ඔවුන් කියන්නේ මේ වර කඨිනය සිරිපාල අයියගේ බවයි.ප්‍රධාන දායකත්වයක් තිබීම වරදක් හැටියට නොදකිමි. නමුත් කඨින සිවුර සියළු දායකයින්ගේ ආධාරයෙන් සකස් කර ගත යුතු යි. මෙවැනි සමගියක් ඇතුව ලංකාවේ වැඩ සිටින සියලුම භික්ෂූන්වහන්සේලා සමගිව එකට එකතු වී සියලු ගිහියන් එකට එකතු වූ එක කඨින පිංකමක් සිදුකරගත හැකි නම් කොතරම් වටිනවා ද යන්න මෙයින් තේරුම් ගත යුතු යි. එසේ ගිහිපැවිදි අප සමගියෙන් එකට එකතු උනොත් අපට උපද්‍රව නැත. බියක් ද නැත. එසේ සමගියෙන් කටයුතු කළොත් බුදුදහමට විරුද්ධව එන බලවේග සියල්ල නැතිකර ගත හැකිය නූතනයේ බුදු දහම විනාශ කිරීමට විවිධ බලවේග ක්‍රියාත්මක වන බව පෙනේ. එවැනි අවස්ථාවක අප එකිනෙකා දේශපාලන වශයෙන් හෝ වෙනත් පටු භේද වලින් භේද නොවී එකට සමගියෙන් ක්‍රියා කළ හොත් ඒ සියළු බලවේග මර්දනය කළ හැකි ය.

පසුගිය දා අපි 2600 සම්බුද්ධත්ව ජයන්තිය සිහිපත් කළෙමු. මෙහිදී අපේ බොහෝ දෙනාට බෞද්ධයාගේ අනන්‍යතාවය තේරුම් ගැනීමට නොහැකි වූ බව කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කළ යුතු යි. බෞද්ධකම තේරුම්ගත් අය බුදුන්වහන්සේ හඳුනාගෙන කටයුතු කළ බව සතුටින් ප්‍රකාශ කළ යුතුයි. අද බොහෝ දෙනාට බුදුන්වහන්සේ හඳුනාගැනීමට නොහැකි වී තිබේ. මේ දිනවල චිත්‍රපට ශාලාවල ''ගාමිණී'' නමින් චිත්‍ර පටයක් ප්‍රදර්ශනය වෙයි. එහි බෞද්ධ භික්ෂුවක් ලෙසින් පෙනී සිටින නළුවෙකුගේ මුවින් මෙවන් ප්‍රකාශයක් ඇසෙයි. ''ආත්මාරක්ෂාව සඳහා මිනිසුන් මැරුවාට වරදක් නැති බව බුදුන්වහන්සේ ප්‍රකාශ කර තිබේ.. '' මෙය සාපරාධී බරපතල ප්‍රකාශයකි. මේ චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා කවුරු උනත් ඔහු බුදුන්වහන්සේ හඳුනාගත් කෙනෙකු නොවේ. තථාගතයන් වහන්සේ කිසිදු හේතුවක් නිසා මිනිස් ඝාතනය අනුමත කොට නැත.

උපසම්පදා භික්ෂුවකට මරණය ගැන වර්ණනා කිරීම පවා තහනම් කොට ඇති බව "මනුසස විගගහ පාරාජිකාපතතියේ " එයි. පැරණි කාලයේ නම් රැගුම් පාලක මණ්ඩලයක් මුලින්ම චිත්‍රපටය නරඹා නුසුදුසු දේ ඉවත් කළ බව දනිමු. නූතනයේ එවැනි මණ්ඩලයක් තිබේ නම් ඔවන් නිදි ද? කියා ප්‍රශ්න කිරීමට සිදුවී ඇත. බුදුන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතයට මෙවැනි අභියෝග ආ අවස්ථාවක ගිහි පැවිදි අප හැමෝම එකට එකතු උනොත් ඒ අභියෝග ජය ගත හැකිය .

අද පෝය දින මේ දහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තුවන්නේ සකස් වීමක පවත්නා වටිනාකම ප්‍රදර්ශනය කිරීම යි. ගිහි බෞද්ධ ගෙවල්වල අඹුසැමිවරුන් හැටියට ක්‍රියා කරන බොහෝ දෙනාතුළ සමගියක් නැත. එයින් කියවෙන්නේ ඔවුන් සකස් වී නැති බවයි. විවාහ වීමට පෙර ගැහැනු ළමුන් පිරිමි ළමුන් සමග එක්ව පාරේ යන විට පෙනෙන්නේ ඒ ළමුන්ගේ එක් අතක් නැති බවයි. එසේ සමගියෙන් ක්‍රියා කිරීම ඉතා හොඳයි. නමුත් විවාහය ලියා පදිංචි කොට ටික කලක් ගිය පසු ඒ සමගිය දැකිය නොහැක. එසේ අසමගි කම් ඇතිකරගන්නේ සකස් නොවූ අඹු සැමියන් ය. එවැනි විවාහ ජීවත වල ශක්තියක් නැත. අර්බුද වැඩිය. බියෙන් ජීවත් වෙයි. බුදුන්වහන්සේ අපේක්ෂා කළේ අර්බුද නැති බිය නැති විවාහ ජීවිතය දෙවියෙක්, දෙවඟනක් හා ජීවත්වන පවුල් ජීවිතය වශයෙන් දක්වා ඇත්තේ දෙදෙනාම සමගියෙන් කටයුතු කිරීම යි. පසුගිය දිනෙක මම දුරකථනයෙන් ගෙදරකට කථා කළෙමි. ටෙලිෆෝනය ගත්තේ නෝනා මහත්මිය යි. මම ඇයගෙන් ඇසුවේ මහත්මා සිටිනවාද කියා යි. සිටිනා බව ඇය පැවසු විට මහත්මාට කථා කරන්න කියා මම කීවෙමි. එවිට ඇය පැටියෝ ඔයාට ලොකු හාමුදුරුවෝ කථා කරනවා යයි කිවා ය. එය ඇසෙන විට මගේ සිතට ලොකු සතුටක් දැනිනි. ඒ දෙපල විවාහ වී අවුරුදු 20ක් විතර ගත වෙනවා. එතරම් කාලයක් ගත වෙලත් මහත්මාට පැටියෝ කියා ආමන්ත්‍රණය කරයි නම් එය ඉතාම වටී. ඒ දෙපොළම සකස් වූ දෙපළ කි. ඔවුන් විවාහ වී වසර 05ක් පමණ ගතවන තුරු දරුසම්පත් ලැබුනේ නැත. නමුත් ඒ දෙදෙනා එම හේතුව අසමගියකට හේතුවක් කර නොගත්හ. දැන් දරු සම්පත් ලබා සතුටින් ජීවත් වෙති. මෙයට හේතුව දෙදෙනාම සකස් වීම යි. එවැනි විවාහ ජීවත කොතරම් වටී ද?

ගිහි ගෙවල්වල ගැහැනු ළමුන් විවාහකර දීමේදී දායාද එකතු කිරීම දෙමාපියන්ගේ ප්‍රධාන කාර්යය වී තිබේ. නමුත් සමහර තරුණයින් ඇවිත් කියන්නේ මට දයාද උවමනා නැත. මේ දරුවා පමණක් ප්‍රමාණවත් බවයි. මෙසේ වීමට හේතුව කුමක් ද? ඒ ගැහැනු ළමයා සකස් වූ කෙනෙක් බව ඒ තරුණයා දන්නා බව යි. සකස් නොවූ සමහර ගැහැනු ළමුන් සඳහා අල්මාරි ලොරියක් , මහණ මැෂින් ලොරියක්, දයාද වශයෙන් දෙන බව කීවත් එවැනි අය බාරගැනීමට ඉදිරිපත් නොවේ. ඊට හේතුව ඒ ළමයා සකස් නොවූ කෙනෙක් බව ඔවුන්ට ආරංචිවී ඇති නිස යි. තරුණයින් ද මෙසේ සකස් නොවුවොත් එවැනි කෙනෙකුට තම දියණිය විවාහකරදීමට දෙමාපියෝ ඉදිරිපත් නොවේ.

අප මෙතෙක් කී කරුණු වලින් පැහැදිලි වන්නේ කඨින පිංකම තුළින් සකස්වන ගිහි පැවිදි දෙපක්‍ෂයම ශක්තිමත් ජීවිත ගත කරන බවයි. මේ ශක්තිය තවදුරටත් ක්‍රියාත්මක කළ හොත් අපිට මේ සසර ගමන අවසන් කොට නිවන් සම්පත්තිය උදාකරගත හැකි ය. සමාජයේ බොහෝ දෙනා විවිධ පරිත්‍යාග කරන බව පෙනේ. නමුත් ඒ පරිත්‍යාග කරන ඔවුන්ගේ මනස සකස් වී නැත. සමහරු දිව්‍යලෝක සැප , මනුෂ්‍ය ලෝක සැප, ප්‍රාර්ථනා කරමින් පිංකම් කරති. එසේ කාම සම්පත් අපේක්ෂා කරන්නේ සකස් නොවූ මනසක් ඇති අයයි. සකස් වූ මනසක් ඇති අය එවැනි පරිත්‍යාග කරන්නේ නිවන් සම්පත්තිය ප්‍රාර්ථනා කර ගෙන යි.

කඨින පිංකම්වලදී බොහෝ දෙනා එවැනි අප්‍රමාණ පරිත්‍යාග කරනු පෙනේ. කඨින ආනිශංසවලදීත් බොහෝ විට ඇසෙන්නේ දිව්‍ය සම්පත්, මිනිස් සම්පත් ලබා ගැනීම පිළිබඳව යි. නමුත් අප ප්‍රාර්ථනා කළ යුත්තේ නිවන් සමපත්තිය යි. මෙසේ අපි සියළුම දෙනා පිළිවෙලකට වැඩ කිරීමෙන් ශක්තිමත් ජීවත ගොඩ නගා ගනිමු.